රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/GFS/01/01/08 – Volume 1 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020.12.16

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්,

**රජයේ මූල්‍ය නොවන වත්කම් (ඉඩම් හා ගොඩනැගිලි) තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම**

2020.11.30 දිනැතිව නිකුත් කරන ලද අංක 06/2020 දරණ අයවැය චක්‍රලේඛය හා බැඳේ.

02. 2020 වර්ෂය තුළ අමාත්‍යාංශ ව්‍යුහය හා එහි කාර්යභාර්යයන් වෙනස්වීමත් සමඟ 2019 වර්ෂයේ පැවති සමහර අමාත්‍යාංශ අහෝසි වීමත්, නව අමාත්‍යාංශ ඇතිවීමත්, සමහර අමාත්‍යාංශවල විෂය පථයන් වෙනස් වීමත් සිදු විය.

03. මෙ හේතුවෙන් උක්ත චක්‍රලේඛයේ 18 සිට 22 දක්වා වූ ඡේද මඟින් මූල්‍ය නොවන වත්කම් පැවරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇති පරිදි **එක් එක් වැය ශීර්ෂවලට අදාළ ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව මෙම වර්ෂය තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.**

04. මේ අනුව, මෙතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ගිණුම්ගත කර ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් නිසි පරිදි පවරා දීමේ හා පවරා ගැනීමේ කටයුතු සිදු කරන ලෙසත්, එම වටිනාකම් නව අමාත්‍යාංශ වෙත් කිරීම් තුළ නිවැරදි ශීර්ෂය යටතේ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙසත්, ගිණුම්ගත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි විස්තර මෙ සමඟ අමුණා ඇති ආකෘතිය (අ) (Format A) පරිදි සම්පූර්ණ කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

05. එම ආකෘති පත්‍රය පහත ආකාරයෙන් බාගත කර ගත හැකිය.
www.treasury.gov.lk → About us → MoF Departments →
Department of State Accounts → Links → Download Formats →
Information of Lands and Buildings (Format A)

06. එසේ සම්පූර්ණ කර Save කරන ලද ආකෘති පත්‍රය 2021.02.10 වන දිනට ප්‍රථම gfs.sad.treasury@gmail.com යන විද්‍යුත් තැපැල හරහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

07. CIGAS වැඩසටහනෙහි වත්කම් ගිණුම්ගත කිරීමේදී වත්කම් ලෙජර් ලැයිස්තුවේ හා වත්කම් වාර්තාවෙහි එන වටිනාකම් සමාන විය යුතු අතර එහිදී යම් තාක්ෂණික සහයෝගයක් අවශ්‍ය වන්නේ නම් මෙම දෙපාර්තමේන්තුවේ පද්ධති සංවර්ධන හා පුහුණු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සම්බන්ධ කර ගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

08. ඉහත තක්සේරු කර ඇති ඉඩම් හා ගොඩනැගිලිවලට අමතරව තවදුරටත් ඔබ අමාත්‍යාංශය යටතේ හඳුනා ගත් තක්සේරු කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි පවතී නම් ඒ පිළිබඳ තොරතුරු මෙම දෙපාර්තමේන්තුවට පිටපතක්ද සහිතව තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

09. මෙම නව අමාත්‍යාංශ ව්‍යුහය යටතේ ඔබ අමාත්‍යාංශයට අයිති තක්සේරු කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි නොමැති නම් ඒ පිළිබඳවද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට වාර්තා කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ටී.එන්. ඔෂන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට